www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව ව්‍යාජ 'දුප්පතුන් සඳහා වූ' අයවැයක් ඉදිරිපත් කරයි

## Sri Lankan government announces a phoney "pro-poor" budget

**සමන් ගුනදාස විසිනි**
**2005 දෙසැම්බර් 12**

මසකට අඩු කාලයක් තුල දෙවන වරට, ශ්‍රී ලංකා ආන්ඩුව පසු ගිය බ්‍රහස්පතින්දා අයවැය ඉදිරිපත් කලේ ය. සුභසාදන ක්‍රියා මාර්ගයන්, ගම්බද සහන හා රාජ්‍ය සේවා වැටුප් ආදියේ සීමිත වැඩිවීම් සහිත මෙම නවතම පිටපත, පාලක සභාගය වන එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) දේශපාලනික සම්පත්වලට රුකුල් දීම සඳහා දරන ලද තවත් රලු ප්‍රයත්නයකි.

නොවැම්බර් 17 ජනාධිපතිවරනයට දින නවයක් තිබිය දී එවකට අගමැති හා එජනිස අපේක්ෂක මහින්ද රාජපක්ෂ ආන්ඩුව අයවැය ඉදිරිපත් කල යුතු බව අවධාරනය කලේ ය. පැහැදිලිවම සමීප තරගයක ප්‍රතිඵල ලැබීමට නියමිතව පැවති තතු තුල එහි යෝජනා නිසැකව ම එල්ල කෙරුනේ ඔහුගේ අපේක්ෂාවන් ඉහලට එසවීමට ය.

අතිශයින් ම පටු මායිමකින් නිලයට රිංගාගත් රාජපක්ෂ, දැන් ජනාධිපති හා මුදල් ඇමති ද ලෙස නව අය වැයක් ඉදිරිපත් කරමින් කියා සිටියේ එය ඔහුගේ "දෘෂ්ටිය" සමග වඩාත් පෙල ගස්වා ඇති බවයි. යථා වසයෙන් ගත් කල, ඔහුගේ මැතිවරන සගයින් වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය (ජාහෙඋ) පවා කැබිනෙට්ටුවට සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කල තතු තුල පුලුල් මහජනතාව අතර අතිශයින් ම පහත වැටුනු විශ්වාසයකට හිමිකම් කියන සුලුතර ආන්ඩුවකට හා ඔහුගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට (ශ්‍රීලනිප) මුක්කුවක් සැපයීම ඔහුගේ උත්සාහය යි.

කිලෝ ග්‍රෑම් 50 පොහොර බෑගයක මිල රු.650 සිට රු. 350 දක්වා පහත හෙලීම, රාජ්‍ය අංශයේ කම්කරුවන්ගේ මාසික වැටුප රු. 1300ක් (ඇ.ඩො.13) ඉහල දැමීම; විශ්‍රාමිකයන්ට රු. 500ක් වැඩි කිරීම; සුභ සාදන දීමනා සියයට 50න් ඉහල දැමීම; වයස 5ට වඩා අඩු ලමයින්ට කිරි ලබා දීම; දුෂ්කර පාසල්වල සිසුන්ට දහවල් ආහාර වේලක් සැපයීම; හා සුනාමියෙන් පීඩාවට පත් වූ ලමයින්ට මසකට රු. 1500ක දීමනාවක් ලබා දීම, නිවේදනය කල අයවැය ක්‍රියාමාර්ගයන්ට අයත් ය. ගොවීන්ට හා කුඩා පරිමාන ව්‍යාපාරයන්ට මුල්‍ය හා බදු සහන ගනනාවක් අයවැයට ඇතුලත් ය.

තම මැතිවරන ප්‍රකාශයට අනුකූලව දුප්පතුන්ට උදව් කිරීම අයවැය මගින් සිදු කරනු ලැබූ බව රාජපක්ෂ ප්‍රකාශ කලේ ය. "අප රටේ දිලිඳුභාවය කාලාන්තරයක් තිස්සේ ඉහල මට්ටමක පවතින බව ඔබට රහසක් නොවේ" යැයි ඔහු පැවසී ය. "පසුගිය කාලයේ ආර්ථික වර්ධනය ... මූලික වසයෙන් කොලඹ නගරය කේන්ද්‍ර කොට ගත්තක් වුනා. සමහර පලාත්වල මොනයම් සංවර්ධනයක් හෝ නැති තරම්... අප රජයේ ඉලක්කය වන්නේ ගතවූ දශක කිහිපයේ දක්නට ලැබුනු වේගයට වඩා වැඩි වේගයකින් දිලිඳු ජනතාවගේ ආදායම වර්ධනය කිරීමත් විශේෂයෙන් ඈත එපිට ප්‍රදේශයන්හි ආදායම වැඩි කිරීමත් ය."

කෙසේ වුවද, "දුප්පතුන් සඳහා" යන අලංකාරෝක්තිය යථාර්ථයට බොහෝ පිටුපසින් පවතියි. සම්පූර්නයෙන්ම ක්‍රියාවට දැමුව ද, දිනකට ඇමරිකානු ඩොලර් 2 (රු.200) ට අඩු ආදායමකින් දිවි ගෙවන ජනගහනයෙන් අඩකට ආසන්න ප්‍රමානයක ජීවන තත්වයන් සැලකිය යුතු අයුරින් වර්ධනය කිරීමට තබා රාජපක්ෂගේ ම මැතිවරන පොරොන්දු වුව සැපිරීමට අයවැය අසමත් වනු ඇත.

පොරොන්දු වූ මසකට රු. 4000හි සමෘද්ධි හෝ සුභසාදන දීමනාව වෙනුවට, සමෘද්ධිලාභීන්ට ලැබෙන්නේ සියයට 50ක වැඩි වීමක් පමනෙකි. එනම් උපරිම දීමනාව වන රු. 1000 රු. 1500 වනවා පමනි.

රාජපක්ෂ ඔහුගේ පලමු වසර තුල රැකියා 200,000 පොරොන්දු විය. අයවැයෙන් සැලසුම් කෙරෙන්නේ උපාධිධාරීන්ට රැකියා 10,000ක් හා අනෙක් තරුන ජනයාට 2006 වසර තුල රැකියා 50,000ක් පමනි. 2007 හි තවත් රැකියා 50,000ක් සැපයේ. පසුගිය වසර තුල එජනිස ආන්ඩුවෙන් උපාධිධාරීන් සඳහා ඇති කල රැකියා අඩු වැටුප් සහිත තාවකාලික ඒවා විය. සමහර රැකියා ස්ථිර කරනු ලැබුනේ මැතිවරනයට අතිශයින්ම ආසන්නයේ දී ය.

සුනාමියෙන් පීඩාවට පත් වූ පවුල්වල ළමයින්ට අයවැයෙන් කුඩා දීමනාවක් ලබා දී තිබෙන නමුත් අනෙකුත් ආධාර සම්බන්ධයෙන් වූවමනාවෙන් ම අපැහැදිලි බවක් දනවයි. සියදහස් ගනන් ජනයා හට ඔවුන්ගේ නිවාස, ජීවනෝපාය හා වත්කම් ද ප්‍රදේශීය පාසැල්, රෝහල් හා අනෙකුත් පහසුකම් ද අහිමි විය. අතිශයින්ම බහුතරයට එක්කෝ කිසිවක් ලැබුනේ නැත. නැතහොත් ලැබුනේ අතිශයින්ම සොච්චමකි.

අයවැයෙන් පොහොර සහනාධාරය වැඩි කර ඇති නමුදු ගොවීන්ට ඊට අමතරව සපයා ඇති සහන ඇත්නම් ඒ අල්පයකි. වී කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 16.50-17.50 මිලක් සහතික කර තිබුන ද ආන්ඩුව වෙන් කර ඇති රු. බිලියන දෙකක මුදල සෑහෙන්නේ රටෙහි වී නිෂ්පාදනයෙන් සියයට 10ටත් අඩු ප්‍රමානයකට ය.

රාජ්‍ය අංශයේ සේවකයන්ට ලැබීමට නියමිත රු. 1300ක මාසික වැටුප් වැඩිවීම, පොරොන්දු වූ රු. 3000ට වඩා සැලකිය යුතු අඩු ප්‍රමානයකි. බහුතර ශ්‍රම හමුදාව වන පුද්ගලික අංශයේ කම්කරුවන්ට කිසිවක් නොලැබේ.

දිවයිනේ වතු අංශයේ මාර්ග "පිළිසකර" කිරීමට හා නිවාස 50,000ක් "යලි සංවර්ධනය" කිරීමට වෙන් කර ඇත්තේ රු. බිලියන දෙකක සොච්චම් ප්‍රමානයකි. තේ හා රබර් වතුවල කම්කරුවන්, ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියෙහි අතිශයින්ම පීඩිත ස්තරයන්ට ඇතුලත් වේ.

කම්කරුවන්ට හා දුප්පතුන්ට අතිශයින්ම සීමිත සහන සලසන අතරතුර මිලිටරියට හා පොලීසියට විශාල වසයෙන් අයවැයෙන් මුදල් වෙන් කර තිබේ. එනම් රුපියල් බිලියන 76 සිට 96.3ක් දක්වා හෝ සියයට 26න් ඉහල දැමීමකි. ආරක්ෂක හමුදාවන් සඳහා වෙන් කර ඇති මුදල මහජන සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති මුලු මුදල වන රු. බිලියන 70ට වඩා සැලකිය යුතු ප්‍රමානයකින් ඉහල ය.

මිලිටරි අයවැය ඉහල දැමීම, රාජපක්ෂගේ වර්ගෝත්තමවාදී සගයන් වන ජවිපෙ හා ජාහෙඋ ඉල්ලා සිටින දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි ප්‍රචන්ඩකාරී ස්ථාවරය සමග ගැලපී ගනියි. යථා වසයෙන් ම, අයවැයට සමස්තයක් ලෙස සහය දෙන පැත්තේ ජවිපෙ සිටින බව සහතික කර ගැනීම පිලිබඳව නව ජනාධිපති උනන්දු විය. අයවැය ප්‍රකාශයට පත් කිරීමට පෙර ජවිපෙ නායකයින් සමග ඔහු පැය දෙකක් ගත කලේ ය.

විවාදය තුල දී, අයවැය අනුමත කරමින් කතා කල ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායමේ නායක විමල් වීරවංශ පාර්ලිමේන්තුවට කියා සිටියේ "අයවැය යෝජනා ජනාධිපති රාජපක්ෂගේ ක්‍රියාමාර්ග ප්‍රතිබිම්බනය කරන්නේ ය" යනුවෙනි. ආන්ඩුවේ ආර්ථික පිලිවෙත් ජනතාව තුලට වංචනිකව ගෙන යාමේ ක්‍රියාකලාපයට ජවිපෙ මූලික වසයෙන් සම්බන්ධ වන බව ඔහුගේ ප්‍රකාශයෙන් පැහැදිලිව දැක්වේ.

## ව්‍යාපාරික උවමනාවන්

ඉදිරිපත් කල අයවැය ක්‍රියා මාර්ග ආන්ඩුව විසින් ක්‍රියාවට දමනු ලැබීම පිලිබඳව සහතිකයක් නොමැත. ප්‍රකාශිත වියදම වන රුපියල් බිලියන 681.6 හා අපේක්ෂිත ආදායම වන රුපියල් බිලියන 484.4 අතර පවතින තියුනු නොගැලපීම පිලිබඳව ආර්ථික විශ්ලේෂකයින් කිහිප දෙනෙකුම අවධානය යොමු කර ඇත.

විශාල සමාගම්වල කෝපරේට් බද්ද සියයට 30 සිට 35 දක්වා වැඩි කිරීමට ද සුරා බදු හා තවත් බදු වැඩි කිරීමට ද රාජපක්ෂ යෝජනා කර තිබේ. නමුත් පවතින අයවැය පරතරය පියවා ගත යුතු වන්නේ දේශීය හා විදේශීය නය මගිනි. පසුගිය මාසයේ ඉදිරිපත්කල අයවැයෙන් අපේක්ෂා කලාට වඩා සියයට 10ක මුදල් ප්‍රමානයක් එනම් රුපියල් බිලියන 76.8ක් විදේශීය නය මගින් ලබා ගැනීමට මෙම අයවැය බලාපොරොත්තු වෙයි.

ආර්ථික විශ්ලේෂකයින්, ව්‍යාපාරික කන්ඩායම් හා ජාත්‍යන්තර මූල්‍ය ආයතන දැනට අයවැය පිලිබඳ සැක මතු කර ඇත. විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීම එල්ල කර ගනිමින් තව දුරටත් ආර්ථික ප්‍රතිව්‍යුහගතකිරීම් ක්‍රියාත්මක කිරීමට හා වියදම් පාලනය කිරීමට ආන්ඩුවට පීඩනය යෙදෙන බව පිලිබඳව කිසිම සැකයක් නැත.

සෙනසුරාදා ද අයිලන්ඩ් පුවත්පතෙහි කතු වැකිය මෙම ව්‍යායාමය "දුප්පතුන් සඳහා කිරිපැනි අය වැයක්" යයි හඳුන්වමින් මෙසේ ලිවී යː "අය වැය පිලිබඳව එජාපය (විරුද්ධ පක්ෂය) පවසා ඇත්තේ පුඩිම පිලිබඳව නියම සහතිකය පවතින්නේ එය ආහාරයට ගැනීමේ දී බව ය. නමුත් කෑමට පෙර එය සෑදිය යුතු ය. නැතහොත් මිලට ගත යුතු ය. ඒ සඳහා රටට මුදල් අවශ්‍ය වන අතර ජනාධිපති එය සෙවිය යුතුව ඇත. බාධාව එයයි! ඔහුගේ උත්සාහය සාර්ථක වේවායි අපි ප්‍රාර්ථනා කරමු."

කුඩා ව්‍යාපාර නියෝජනය කරන්නා වූ ජාතික වානිජ මන්ඩලය (එන්සීසී) අයවැය සහනදායී බව අනුමත කර ඇතත් අනෙකුත් ව්‍යාපාර ස්ථරයන් පැහැදිලිවම අසතුට ප්‍රකාශයට පත් කර ඇත. ලංකා ජාතික කර්මාන්ත මන්ඩලයේ (සීඑන්සීඅයි) සභාපති නිමල් පෙරේරා, "නිරතුරුවම පුලුල් වන්නා වූ අයවැය පරතරය" පිලිබඳව අප්‍රසාදය පල කර තිබේ.

ලංකා වෙලඳ මන්ඩලයේ (සීසීසී) සභාපති දේවා රොද්‍රිගු මෙසේ පවසයිː "ව්‍යාපාරික දෘෂ්ටිකෝනයෙන් ගත් කල උද්ධමනය වැඩි කරන්නාවූත්, පොලී රේට්ටුව ඉහල දමන්නාවූත් රුපියල අවප්‍රමාන කරන්නාවූත් ඉහල අයවැය පරතරයකට වඩා ආදායම් බද්දෙහි ඉහල යාම

දුෂ්කර බවෙන් අඩු ය." කෝපරේට් විශ්ලේෂකයෙකු වූ චන්න අමරතුංග රොයිටර් හට පැවසුවේ: "පෙනෙන ආකාරයට, අවම වසයෙන් කෙටි කාලීනව සැලකු කල, සුභ සාදන සහනයන්ට ගෙවනු ලබන්නේ කෝපරේට් අංශය යි" යනුවෙනි.

ආසියානු සංවර්ධන බැංකුවේ (ඒඩීබී) රට බාර අධ්‍යක්ෂ අලෙසන්ද්‍රො පිඕ පරෙස්සම් සහගතව ප්‍රකාශ කලේ "එය අභියෝගයක් වනු ඇත... (අයවැයෙහි) වැඩිපුර වියදම් තිබෙන බැවින් ආදායම් ලබා ගැනීම කෙරෙහි වැඩිපුර අවධානය යොමු කල යුතු ය. බදුවලින් ආදායම වැඩි කර ගැනීම ඔවුන් විසින් සහතික කර ගත යුතුව ඇත." අනතුරුව අයවැය, "සියයට 8ක වර්ධනයකට ලඟාවීම සඳහා උදව්කාරක වනු ඇති බවට ඔවුන් සඳහන් කල එක් අංශයක් වූ මහ පරිමානයේ විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමේ ඇදහස සමග නොගැලපෙනු ඇති බව"ට ඔහු අනතුරු ඇඟවීය.

පිඕ ප්‍රසිද්ධියේ සඳහන් නොකල ද, ප්‍රක්ෂේපිත සියයට 8ක වර්ධන ප්‍රතිශතය හිතලුවක් පමනකි. ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව මෙම වසර සඳහා ඇස්තමේන්තුව සියයට 6කි. ආනයනික තෙල් මිල ඇ.ඩො. මිලියන 800 සිට මිලියන 1500 දක්වා දෙගුන වීම; රෙදිපිලි අපනයනය සඳහා වූ කෝටා ක්‍රමය අවසන් වීම; පසු ගිය දෙසැම්බරයේ සුනාමියේ බලපෑම වැනි ගැටලු සමූහයකින් ආර්ථිකය වෙලී ගොස් ඇත. මෙම වසරේ පලමු මාස නවයේ වෙලඳ හිඟය පසුගිය වසරේ එම කාලය සමග සැසඳූ කල සියයට 20ට ආසන්න ප්‍රතිශතයකින් ඉහල ගොස් ඇති අතර ඔක්තෝබරයේ උද්ධමනය සියයට 12.7 විය.

ආන්ඩුව මූල්‍ය දුෂ්කරතාවන්ට හසුවුවහොත් පරදුවට තැබෙන්නේ මොනවාද යන්න පිලිබඳව සැකයක් නොමැත. ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල පීඩනය මධ්‍යයේ, නය ලබා ගැනීම සඳහා හා ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා රාජපක්ෂ ඔහුගේ "දුප්පතුන් සඳහා වූ" පියවරයන් වේගයෙන් මුහුදු බත් කරනු ඇත.

© www.wsws.org